දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව

உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை

**Inland Revenue Department - Sri Lanka**



# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2019

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2019

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය 246

## පටුන


| | | |
|---|---|---|
| **01 වන පරිච්ඡේදය** | **ආයතනමය පැතිකඩ** | |
| 1.1 | හැඳින්වීම | 3 |
| 1.2 | දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක | 4 |
| 1.3 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් | 5 |
| 1.4 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් | 5 |
| 1.5 | සංවිධානමය සටහන | 7 |
| **02 වන පරිච්ඡේදය** | **ප්‍රගතිය සහ අනාගත දැක්ම** | |
| 2.1 | 2019 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන් | 11 |
| 2.2 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත අරමුණු | 21 |
| **03 වන පරිච්ඡේදය** | **වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධනය** | |
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 27 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 29 |
| 3.3 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් | 32 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 52 |
| 3.6 | වෙන් කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්යසාධනය | 53 |
| 3.7 | මු.රෙ.208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන | 54 |
| 3.8 | මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 54 |
| 3.9 | විගණකාධිපති වාර්තාව | 55 |
| **04 වන පරිච්ඡේදය** | **කාර්යසාධන දර්ශක** | |
| 4.1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්සාධන දර්ශක | 59 |
| 05 වන පරිච්ඡේදය | **තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්ය සාධනය (SDG)** | |
| 5.1 | තිරසාර සංවර්ධන ඉලක්ක | 63 |
| **06 වන පරිච්ඡේදය** | **මානව සම්පත් පැතිකඩ** | |
| 6.1 | කාර්ය මණ්ඩල කළමනාකරණය | 67 |
| 6.2 | මානව සම්පත් සංවර්ධනය | 67 |
| **07 වන පරිච්ඡේදය** | **අනුකූලතා වාර්තාව** | |
| 7.1 | අනුකූලතා වාර්තාව | 83 |
| ඇමුණුම | | |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.බ. | ආදායම් බදු |
| ප්‍රා.ලා.බ | ප්‍රාග්ධන ලාභ බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| ජා.ගො.බ | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ආ.සේ.ගා. | ආර්ථික සේවා ගාස්තු |
| ණ.ආ.බ. | ණය ආපසු ගෙවීමේ බද්ද |
| ඔ.සූ.බ. | ඔට්ටු හා සූදු බද්ද |
| කො.ග.බ. | කොටස් ගනුදෙනු බද්ද |
| වා.හි.බ. | වාහන හිමිකම් බද්ද |
| වි.බ. | විගමන බද්ද |
| මු.බ. | මුද්දර බද්ද |
| භා.සේ.බ. | භාණ්ඩ හා සේවා බද්ද |
| පි.බ. | පිරිවැටුම් බද්ද |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂණ බද්ද |
| ඉ.ක.බ. | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් |
| ත.ආ.බ. | තනි පුද්ගල ආදායම් බද්ද |
| හ.ආ.බ. | හවුල් ව්‍යාපාර ආදායම් බද්ද |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| ස.ආ.බ. | සංස්ථාපිත ආදායම් බද්ද |

# 1 වන පරිච්ඡේදය

# ආයතනමය පැතිකඩ

## 1.1 හැඳින්වීම

බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය යනු ඕනෑම ආර්ථිකයක බදු පද්ධතියෙහි ප්‍රධාන අංගයන්ය. බදු වනාහි ලෝකයේ නවීනතම ආර්ථිකයන් හි රජයේ ආදායම් වල ඉතාමත් වැදගත් මූලාශ්‍රයයි. ආදායම් එක්රැස් කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන සිය ජනතාව මත බදු පැනවීමට රජයන් කටයුතු කරන අතර පසුව එය අයවැය ඉලක්ක සපුරාලීම සඳහා යොදවනු ලබයි. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා බදු ආදායම නිසි පරිදි සුරක්ෂිත කිරීමේ අභිමථාර්ථයෙන් යුතුව 1932 දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (පෙර ආදායම් බදු දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වූ) ආරම්භ කෙරුණි. එතැන් සිට අනෙකුත් අදායම් එකතු කිරීමේ නියෝජිත ආයතන අතර රජයේ ආදායම් එකතු කිරීමේ ලා සැලකිය යුතු අනගිභවනීය කාර්යභාරයක් ඉටු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වුණි. එන්.ජේ. හක්ස්හැම් මහතාගේ සිට, දේශීය ආදායම් ප්‍රධානී ධූරය කොමසාරිස් ජනරාල්වරු 32 කු විසින් හොබවන ලදී. වර්ෂ 2018 දී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ධූරයට පත් වූ ඒ.එන්. ගුරුගේ මහතා, මේ දක්වාම එකී ධූරයේ රාජකාරි හොබවයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ පිහිටා ඇති අතර එහි සමහර අංශයන් කොළඹ 02, නවම් මාවතේ සහ නාරාහේන්පිට මෙහෙවර පියසේ ස්ථාන ගත කර ඇත. තවද, දිවයින පුරා සිටින ජනතාවට වඩාත් ප්‍රශස්ත සේවාවක් ලබා දීමේ අදිටනින් යුතුව දීපව්‍යාප්ත ලෙස විසිරී ඇති ප්‍රාදේශීය කාර්යාල 15 ක් සහ මෙට්‍රොපොලිටන් ශාඛාවන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

වර්ෂ 2019 දී ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැඟීමේ බදු, ආර්ථික සේවා ගාස්තු, ප්‍රාග්ධන ලාභ බදු, ණය ආපසු ගෙවීමේ බදු, මුද්දර බදු සහ ඔට්ටු හා සූදු බදු පරිපාලනය කිරීම හරහා රාජ්‍ය ආදායම වෙත කැපී පෙනෙන ප්‍රශංසනීය දායකත්වයක් ලබා දීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වුණි. තවද 2018 වර්ෂය හා සසඳන කළ බදු ආදායමෙහි විද්‍යමාන වර්ධනයක් පැහැදිලිවම දැකගත හැකිය. අංක 402 දරණ 2002 සැප්තැම්බර් 12 වන දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.4 වගන්තිය අනුව සකසා ඇති මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව තුලින් 2019 වර්ෂය මුළුල්ලේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අත්පත් කරගත් ජයග්‍රහණ පිළිබඳව නිවැරදි විවරණයක් සපයනු ලබයි.

## 1.2 දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක

### දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

### මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

### උපාය මාර්ගික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ විෂය පථය යටතේ වන්නා වූ සියළු අණ පනත් පරිපාලනය කිරීම
- රාජ්‍ය බදු ආදායම රැස් කිරීම
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් පිළිබඳව ප්‍රතිචාර ලබා දීම

## 1.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන්

- පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන අංශය
  - ප්‍රාථමික ලියාපදිංචි කිරීමේ අංශය
  - බදු ලියාපදිංචි අංශය
  - පාරිභෝගික තොරතුරු යාවත්කාලීන කිරීමේ අංශය
  - ව්‍යාපාර උපදේශන අංශය
  - බදු උපකාරක සහ සංවර්ධන අංශය
  - මධ්‍ය ලේඛන කලමනාකරණ අංශය

- සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
  - මධ්‍ය පරිමාණ අංශයන්
  - විශාල පරිමාණ අංශයන්

- සංස්ථාපිත නොවන අනුකූලතා හා විගණන අංශය
  - ඉහළ ආදායම් සංස්ථාපිත නොවන VIP & RTP අංශය
  - නගරබද සංස්ථාපිත සේවා නියුක්ති අංශය

- නගරබද හා ප්‍රාදේශීය අංශය
  - නගරබද අංශයන්
  - පළාත්බද අංශයන්

- අභියාචනා අංශය
  - සංස්ථාපිත නොවන අභියාචනා සහ විරෝධතා අංශය
  - සංස්ථාපිත අභියාචනා සහ විරෝධතා අංශය
  - මහා පරිමාණ, ව්‍යාපාර අභියාචනා සහ විරෝධතා අංශය

- ආපසු ගෙවීමේ අංශය
  - සංස්ථාපිත අභියාචනා සහ විරෝධතා අංශය
  - මහා පරිමාණ, ව්‍යාපාර අභියාචනා සහ විරෝධතා අංශය

- පැහැර හරින ලද බදු අංශය
  - සංස්ථාපිත අභියාචනා සහ විරෝධතා අංශය
  - මහා පරිමාණ, ව්‍යාපාර අභියාචනා සහ විරෝධතා අංශය
  - පැරණි අංශ

- ලේකම් අංශය
  - බදු ප්‍රතිපත්ති සහ නීති සම්පාදන අංශය
  - ආදායම් අධීක්ෂණ අංශය
  - ජාත්‍යන්තර බදු ප්‍රතිපත්ති අංශය

- මූලාශ්‍ර බදු අංශය
  - ආ.සේ.ගා. අංශය
  - උ.වි.ගෙ. අංශය
  - ර.ගැ.බ. අංශය
  - මුද්දර බදු අංශය
  - ප්‍රාග්ධන ලාභ බදු අංශය

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිපාලන අංශය
  - මධ්‍යම සැකසුම් අංශය
  - තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා අංශය
  - ගෙවීම් සහ සැසඳුම් අංශය


- වංචා වැලැක්වීමේ සහ විමර්ශන අංශය
  - වංචා වැලැක්වීමේ සහ අභ්‍යන්තර විමර්ශන අංශය
  - විමර්ශන අංශ
  - බුද්ධි අංශය
  - තොරතුරු සහ අනිවාර්ය ලියාපදිංචි අංශය

- මානව සම්පත් සහ වත්කම් පරිපාලන අංශය
  - මානව සම්පත් පරිපාලන අංශය
  - මානව සම්පත් සංවර්ධන අංශය
  - ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශය
  - වෙනස්වීම් කළමනාකරණ අංශය

- ගිණුම් අංශය
  - ගිණුම් අංශ
  - අභ්‍යන්තර විගණන අංශය

- ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ව්‍යාපෘති අංශය

# ආයතනික ව්‍යුහය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2019.12.31 දිනට



# 02 වන පරිච්ඡේදය

# ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1 2019 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන්

### 2.1.1 වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ.

**වගුව 2.1: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු**

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2017 අංක 24 දරන දේශීය අදායම් පනත |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06 සහ 2006 අංක 08 , 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11, 2016 අංක 20, 2018 අංක 25 සහ 2019 අංක 19 දරන පනත් වලින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තුව | 2007 අංක 15, 2008 අංක 11, 2009 අංක16, 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9, 2015 අංක 13, 2017 අංක 7 සහ 2018 අංක 33 දරන පනත් වලින් සංශෝධික 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10, 2015 අංක 12 , 2016 අංක 22, 2017 අංක 13 ,2018 අංක 20 සහ 2019 අංක 20 දරන පනත් වලින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කලින් බලාත්මකව තිබූ දැනට අවලංගු කර හෝ අහෝසි කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් අය කාර්යයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**වගුව 2.2: අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2019 වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු**

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1991 අංක52 දරන ජාතිය රැක ගැනීමේ දායක බදු පනත, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් පනත, සංශෝධිත පරිදි |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, සංශෝධිත පරිදි |
| වාහන හිමිකම් බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.2. මුළු ආදායම රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුළ දී රු. 1,025,319,006,780/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.)

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 1,025,319ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 124,971 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය **(RAMIS)** ක්‍රියාත්මක කිරීම ඇතුළුව බදු අනුකූලතාවය වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ගය හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් මෙම ජයග්‍රහණය සාක්ෂාත් කර ගැනීමට හැකි විය.


රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 54.22% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 98.77% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 96.78% ක් විය.

**වගුව 2.3: මුළු ආදායම රැස්කිරීම**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස්කිරීම් ඇස්තමේන්තු වේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමට % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 318,000,000,000 | 371,795,681,316 | 116.92% | 36.26% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 2,000,000,000 | 602,439,115 | 30.12% | 0.06% |
| එකතු කළ අගය මත බද්ද | 529,000,000,000 | 443,877,131,612 | 83.91% | 43.29% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 91,000,000,000 | 105,185,802,597 | 115.59% | 10.26% |
| ආර්ථික සේවා ගාස්තු | 65,000,000,000 | 55,301,397,165 | 85.08% | 5.39% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 28,000,000,000 | 28,673,572,980 | 102.41% | 2.80% |
| ඔට්ටු හා සූදු බද්ද | 3,500,000,000 | 2,435,982,807 | 69.60% | 0.24% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,610,000,000 | 1,023,443,599 | 63.57% | 0.10% |
| වාහන හිමිකම් බද්ද | - | 1,498,601,586 | - | 0.15% |
| විගමන බද්ද | 16,000,000 | 5,008,044 | 31.30% | 0.00% |
| මුද්දර බද්ද | - | 14,863,016,823 | - | 1.45% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 17,036,964 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 29,626,965 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 9,045,921 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | - | 1,219,286 | - | 0.00% |
| ප්‍රේෂණ බද්ද | 3,000,000 | - | - | 0.00% |
| **මුළු ආදායම් රැස්කිරීම** | **1,038,129,000,000** | **1,025,319,006,780** | **98.77%** | **100.00%** |

මූලාශ්‍රය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.1: මුළු ආදායම් රැස් කිරීම**





මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**වගුව 2.4: ආදායම් රැස් කිරීම සැසඳීම - 2019 සහ 2018**

| බදු වර්ගය | **2019** ආදායම් රැස් කිරීම් රු. | **2018** ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 371,795,681,316 | 257,366,657,198 | 44.46% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 602,439,115 | 104,148,162 | 478.44% |
| එකතු කළ අගය මත බද්ද | 443,877,131,612 | 461,650,624,889 | -3.85% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,185,802,597 | 105,690,527,186 | -0.48% |
| ආර්ථික සේවා ගාස්තු | 55,301,397,165 | 52,978,509,494 | 4.38% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 28,673,572,980 | 4,501,166,919 | 537.03% |
| ඔට්ටු හා සූදු බද්ද | 2,435,982,807 | 2,469,578,624 | -1.36% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,023,443,599 | 1,196,346,653 | -14.45% |
| වාහන හිමිකම් බද්ද | 1,498,601,586 | 2,191,685,363 | -31.62% |
| විගමන බද්ද | 5,008,044 | 16,682,442 | -69.98% |
| මුද්දර බද්ද | 14,863,016,823 | 12,026,430,018 | 23.59% |
| භාණ්ඩ හා සේවා බද්ද | 17,036,964 | 2,000 | - |
| පිරිවැටුම් බද්ද | 29,626,965 | 88,934,025 | -66.69% |
| ජාතික ආරක්ෂක බද්ද | 9,045,921 | 40,986,382 | -77.93% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1,219,286 | 26,198,521 | -95.35% |
| ප්‍රේෂණ බද්ද | - | - | - |
| **මුළු ආදායම් රැස්කිරීම** | **1,025,319,006,780** | **900,348,477,876** | **13.88%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.2: ආදායම් රැස් කිරීම සැසඳීම - 2019 සහ 2018**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.3. රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

2019 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 2.5 වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 2.3 සටහනින් නිරූපණය කෙරේ. 2019 වසරේ රජයේ මුළු ආදායම රුපියල් මිලියන 1,890,899 ක් වූ අතර එයින් 54.22% ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත..

දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමේ අගය ප්‍රතිශතයක් ලෙස ගත් විට 2019 වර්ෂය සඳහා 6.83% ක් වේ.


**වගුව 2.5: රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට (පවත්නා මිල ගණන් යටතේ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදනය (රු. මිලියන) | දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2015 | 1,454,878 | 560,422 | 38.52% | 10,950,621 | 5.12% |
| 2016 | 1,686,061 | 641,547 | 38.05% | 11,996,083 | 5.35% |
| 2017 | 1,831,531 | 836,518 | 45.67% | 13,328,103* | 6.28% |
| 2018 | 1,919,973 | 900,348 | 46.89% | 14,366,103* | 6.27% |
| 2019 | 1,890,899 | 1,025,319 | 54.22% | 15,016,142 | 6.83% |

*සංශෝධිත

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සටහන 2.3: රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.4. මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු, දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු - මුළු එකතුවෙන් 33.33%

මුද්දර ගාස්තුව - මුළු එකතුවෙන් 100.00%

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.6 වන වගුවෙහි දැක්වේ.

**වගුව 2.6: බදු ආදායම් රැස් කිරීම් පළාත් සභාවලට මාරු කිරීම - 2019**

| | මුළු රැස්කිරීම් (රු.) | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය (රු.) | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,185,802,597 | 34,513,372,984 | 33.33% |
| මුද්දර බද්ද | 14,863,016,823 | 14,863,016,823 | 100% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.5. බදු ගෙවන්නන් ලියාපදිංචි වීමේ විස්තර

2019 වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විවිධ බදුකරණ කටයුතු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 2.7 වගුවෙහි දක්වා ඇත.

**වගුව 2.7: 2019.12.31 දිනට ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| ආදායම් බද්ද | | |
| <u>සංස්ථාපිත</u> | | |
| වාසික සමාගම් / නිර්වාසික සමාගම් | 56,460 | |
| <u>සංස්ථාපිත නොවන</u> | | |
| තනි පුද්ගල | 281,105 | |
| හවුල් ව්‍යාපාර | 17,300 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 804 | |
| උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තියන් (උ.වි.ගෙ.) | 1,149,883 | |
| ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව | | **1,505,552** |
| අනෙකුත් බදු ගෙවන්නන් | | |
| ආර්ථික සේවා ගාස්තුව සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 17,359 | |
| එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 28,914 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 237 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 92,028 | |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 237 | |
| ඔට්ටු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 631 | |
| සූදු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 4 | |
| මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව | | **139,410** |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 35,448 | |
| පොළිය මත රඳවා ගැනීමේ බදු (රඳවා ගැනීමේ නියෝජිතයන්) | 1,627 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවා ගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 13,764 | |
| මුද්දර බදු (විධිමත් කාර්තුමය උපලේඛනගත සැපයුම්කරුවන්) | 9,432 | |
| | | **60,271** |
| **2019.12.31** දිනට මුළු බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව | | **1,705,233** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.6. ඵලදායිතා අනුපාතය

2019 වසරේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,535.13 ක් වූ අතර, රැස් කළ ආදායම රුපියල් මිලියන 1,025,319.01 ක් විය. එබැවින් ඵලදායිතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 226:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය, ශත 44 ක් ලෙස ගණනය කෙරේ. ආනයනයේදී අය කරන ලද එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු හැර දේශීය ආදායම් දෙපාර්තමේනතුවේ ආදායම් රැස්කිරීමේ පිරිවැය රුපියල් 100 ක් සඳහා ශත 54 ක් විය. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 46 සහ ශත 58 ක් විය.)

2017 - 2019 වසර දක්වා ආදායම් රැස් කිරීම, මුළු වියදම් සහ රැස් කිරීමේ පිරිවැයෙහි වර්ගීකරණය 2.8 වන වගුවෙහි දැක්වේ.

වගුව 2.8: ආදායම් රැස් කිරීමල මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය (රුපියල් මිලියන)

| විස්තරය | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| <u>ආදායම් රැස් කිරීම</u> | | | |
| ආදායම් බද්ද | 229,841.81 | 257,366.66 | 371,795.68 |
| ආර්ථික සේවා ගාස්තුව | 44,719.76 | 52,978.51 | 55,301.40 |
| එකතු කළ අගය මත බද්ද | 443,739.47 | 461,650.62 | 443,877.13 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 101,824.56 | 105,690.53 | 105,185.80 |
| ඔට්ටු හා සූදු බද්ද | 1,929.03 | 2,469.58 | 2,435.98 |
| කොටස් ගනුදෙනු බද්ද | 1,333.90 | 1,196.35 | 1,023.44 |
| වාහන හිමිකම් බද්ද | 1,650.96 | 2,191.68 | 1,498.60 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | 4,501.17 | 28,673.57 |
| විගමන බද්ද | 4.1 | 16.68 | 5.01 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | - | 104.14 | 602.44 |
| සමාජ වගකීම් බද්ද | - | - | - |
| පිරිවැටුම් බද්ද | 20.75 | 88.93 | 29.63 |
| මුද්දර බද්ද | 11,377.13 | 12,026.43 | 14,863.02 |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.12 | - | 17.04 |
| ජාතික ආරක්ෂක බද්ද | 15.95 | 40.99 | 9.05 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 52.77 | 26.2 | 1.22 |
| ඉඩම් බද්ද | 7.38 | - | - |
| **මුළු එකතුව** | **836,517.69** | **900,348.47** | **1,025,319.01** |
| <u>**වියදම්**</u> | | | |
| <u>**පුනරාවර්තන වියදම්**</u> | | | |
| පඩිනඩි | 2,103.06 | 2,433.27 | 2,712.91 |
| ගමන් වියදම් | 122.37 | 37.82 | 22.55 |
| සැපයුම් හා උපකරණ | 108.89 | 116.24 | 170.84 |
| නඩත්තු හා අලුත්වැඩියා | 60.72 | 72.65 | 142.41 |
| කොන්ත්‍රාත් සේවා | 579.47 | 737.22 | 720.17 |
| මාරු කිරීම් | 40.09 | 42.96 | 43.85 |
| <u>**ප්‍රාග්ධන වියදම්**</u> | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් | 61.08 | 52.67 | 114.85 |
| අත්පත් කර ගැනීම් | 53.44 | 38.9 | 144.55 |
| ධාරිතා ගොඩනැංවීම් | 127.82 | 180.92 | 42.80 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 1,067.93 | 288.84 | 364.27 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | 12.29 | 132.81 | 55.93 |
| **මුළු වියදම** | **4,337.16** | **4,134.30** | **4,535.13** |
| | | | |
| රු. 100 ක් රැස් කිරීම සඳහා පිරිවැය | **0.52** | **0.46** | **0.44** |
| රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කළ අගය මත බදු ,ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු හැර) | **0.67** | **0.58** | **0.54** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.1.7. බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

2019 වර්ෂය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. මෙම වැඩසටහන් වල දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ බදු ගෙවන්නන්ට බදු නීතියේ වෙනස්වීම පිළිබඳව සහ ඊ-සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීම සම්බන්ධයෙන් දැනුම ලබා දීමයි.

**වගුව 2.9: ජනතාව සඳහා 2019 වර්ෂයේ දී පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| | විෂය | ආයතනය | සහභාගී වූ පුද්ගලයින් |
|---|---|---|---|
| **1** | අධ්‍යාපනික ප්‍රදර්ශනය | වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 500 * |
| **2** | ඊ- සේවාව (රඳවාගැනීම් බදු සහ උ.වි.ගෙ) . | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 160 |
| 3 | ඊ- සේවාව (රඳවාගැනීම් බදු සහ උ.වි.ග) | බැංකු සහ මූල්‍යායතන | 150 |
| 4 | ඊ- සේවාව (රඳවාගැනීම් බදු සහ උ.වි.ගෙ) | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 150 |
| 5 | බදු සායනය | බදු ගෙවන්නන් සහ ව්‍යාපාරික ප්‍රජාව | 180 |
| 6 | බදු සායනය | බදු ගෙවන්නන් සහ ව්‍යාපාරික ප්‍රජාව | 175 |
| 7 | බදුකරණ වැඩමුළුව | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල | 180 |
| 8 | මූල්‍ය සේවා මත එ.අ.බ. | බැංකු සහ මූල්‍යායතන | 130 |
| 9 | බදු සායනය | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 170 |
| 10 | බදු සායනය | බදු ගෙවන්නන් සහ ව්‍යාපාරික ප්‍රජාව, ගාල්ල | 150 |
| 11 | ඊ- පිරවීම (එ.අ.බ. හා ජා.ගො.බ.) | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 180 |
| 12 | ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය (2019/2020) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 160 |
| 13 | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා 2019 - අනුරාධපුරය | ප්‍රදර්ශන කුටිය | 1200* |
| 14 | ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය (2019/2020) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 180 |
| 15 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ./ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 175 |
| 16 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ./ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 180 |
| 17 | බදු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මාර්ග සංවර්ධන අධිකාරිය | 100 |
| 18 | ආදායම් බදු වාර්තා(ත.ආ.බ./හ.ආ.බ./ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 180 |
| 19 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ./ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | රත්නපුර | 225 |
| 20 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කෑගල්ල | 200 |
| 21 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | යාපනය | 400 |

| | | | |
|---|---|---|---|
| 22 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කළුතර | 180 |
| 23 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අනුරාධපුරය | 325 |
| 24 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මීගමුව | 200 |
| 25 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | දඹුල්ල | 452 |
| 26 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ගම්පහ | 180 |
| 27 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදුල්ල | 223 |
| 28 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කුරුණෑගල | 500 |
| 29 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මාතර | 761 |
| 30 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ගාල්ල | 283 |
| 31 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | නුවරඑළිය | 200 |
| 32 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මහනුවර | 500 |
| 33 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ජාවත්ත | 200 |
| 34 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මහරගම | 535 |
| 35 | ආදායම් බදු වාර්තා (ත.ආ.බ./හ.ආ.බ.)පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මඩකලපුව | 400 |
| 36 | බදු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ජාතික සංවර්ධන බැංකුව | 150 |
| 37 | ආදායම් බදු වාර්තා (ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මූල්‍යායතන | 160 |
| 38 | ආදායම් බදු වාර්තා ( ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් - මහනුවර | 125 |
| 39 | ආදායම් බදු වාර්තා ( ස.ආ.බ.) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 230 |
| 40 | ඊ - පිරවීම (ත.ආ.බ./හ.ආ.බ.) | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් / මූල්‍යායතන | 100 |
| 41 | බදු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (එ.අ.බ/ජා.ගො.බ./ර.ගැ.බ./ උ.වි.ගෙ) | ලංකා පොහොර සංස්ථාව | 150 |
| 42 | ඊ - පිරවීම ( ස.ආ.බ.) | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් | 100 |
| | | | |

*ආසන්න අගයන්

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.8. වර්ෂය තුළ සිදු කෙරුණු නීති සම්පාදනයන්

2019 අංක 19 දරණ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

2019 අංක 20 දරණ ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

2019 අංක 21 දරණ මුදල් පනත

**2.1.9. අනුමත පුණ්‍යායතන**

වර්ෂය තුළ දී වගුව 2.10 හි දක්වා ඇති පුණ්‍යායතන සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

**වගුව 2.10: 2019 වර්ෂයේ දී අනුමැතිය ලබා දුන් පුණ්‍යායතන**

| පුණ්‍යායතනය | ගැසට් අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|
| එතනමඩල සහන වැඩිහිටි නිවාසය | 2127/14 | 12.06.2019 |
| පිළිකා සරණ සංගමය - ශ්‍රී ලංකාව | 2142/81 | 27.09.2019 |
| ආබාධිත පුද්ගලයින් සඳහා මධ්‍යස්ථානය | 2144/23 | 09.10.2019 |

**2.1.10. නිකුත් කල ගැසට් නිවේදන**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන අදාළ පනත් යටතේ සලකා බලන වර්ෂය තුළ පහත දැක්වෙන ගැසට් නිවේදන නිකුත් කර ඇත.

**වගුව 2.11: 2019 වර්ෂයේ දී නිකුත් කළ ගැසට් නිවේදන**

| | ගැසට් අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| I | 2124/03 | 21.05.2019 | හෝටල් , සංචාරක නියෝජිතයින් විසින් සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද |
| II | 2125/69 | 01.06.2019 | 2005 අංක 6 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 2 අ වගන්තිය යටතේ නියෝගය |
| III | 2147/59 | 31.10.2019 | එකතු කළ අගය මත බදු පනත යටතේ සහාධිපත්‍ය නිවාස ඒකක සඳහා පනවනු ලබන නියෝගය |
| IV | 2151/52 | 29.11.2019 | 2019 දෙසැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝගය (හෝටල් සහ මූල්‍ය සේවා, භාණ්ඩ ආනයන හෝ සැපයීම) |
| V | 2151/60 | 06.12.2019 | එකතු කළ අගය මත බදු පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2019.11.29 දින අංක 2151/52 දරන අති විශේෂ ගැසට් පත්‍රය සංශෝධනය කිරීම |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.1.11. 2019 වර්ෂය තුළ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් හා සම්බන්ධ කටයුතු**

- චෙක් ජනරජය සමඟ සංශෝධිත ගිවිසුම

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ මට්ටම දක්වා ව්‍යවස්ථාපිත පරිපාටිය සම්පූර්ණ කර ඇති අතර රාජ්‍ය මට්ටමින් අත්සන් කිරීමේ පියවරට එළඹීමට නියමිතය.

- ඩෙන්මාර්කය සමඟ සශෝධිත ගිවිසුම

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ මට්ටම දක්වා ව්‍යවස්ථාපිත පරිපාටිය සම්පූර්ණ කර ඇති අතර රාජ්‍ය මට්ටමින් අත්සන් කිරීමේ පියවරට එළඹීමට නියමිතය.

- මාලදිවයින සමඟ නව ගිවිසුම

2019 ජුලි 15-19 දක්වා පළමු වටයේ සාකච්ඡාවන් ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවැත්වුන අතර එකඟ වූ කෙටුම්පත, නිලධාරී මට්ටමින් 2019 ජුලි 19 වන දින අත්සන් තැබිණි.

- සයිප්‍රසය සමඟ සශෝධිත ගිවිසුම

2019 ඔක්තෝබර් 29-31 දක්වා පළමු වටයේ සාකච්ඡාවන් සයිප්‍රසයේ නිකෝසියාවේ පැවැත්වුන අතර එකඟ වූ කෙටුම්පත, නිලධාරී මට්ටමින් 2019 ඔක්තෝබර් 31 වන දින අත්සන් තැබිණි.

- ඕමානය සමඟ සංශෝධිත ගිවිසුම

පාර්ලිමේන්තු අනුමැතිය ලැබුනු අතර අංක 2154/50 දරණ ගැසට් නිවේදනය 2019 දෙසැම්බර් 20 වන දින නිකුත් කරන ලදී.

## 2.2. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත අරමුණු

### 2.2.1. අභියෝග

#### 2.2.1.1. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

බදු ගෙවීම මඟහැරීම හා බදු ගෙවීම පැහැර හැරීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථා ඇහිරීමෙන් සහ බදු ගෙවීම සඳහා ඇති අනුකූලතාවය ඉහළ නැංවීම මගින් ආදායම් එක්රැස් කිරීම දියුණු කිරීමට ස්ථිර සහ ශක්තිමත් බදු පරිපාලනය මනා සහයෝගයක් ලබා දේ. රටක දළ දේශීය නිෂ්පාදනයට බදු ආදායමෙහි දායකත්ව අනුපාතය කාර්යක්ෂම හා ගුණාත්මක බදු පරිපාලනය මත රඳා පවතී. දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට ශ්‍රී ලංකාවේ බදු ආදායම් දායකත්වය වර්ෂ 2018 දී 11.9% වූ අතර එය වර්ෂ 2019 දී 11.6% කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, අනාගත ආයෝජන සහ තිරසාර ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම සඳහා අවැසි මූල්‍යමය ශක්තිය තහවුරු කරනු පිණිස, සංවර්ධනය වෙමින් පවතින රටවල දළ දේශීය නිෂ්පාදනයට බදු ආදායම් රැස් කිරීමේ අනුපාතය අවම වශයෙන් 15% ක්වත් විය යුතුය. නිරන්තරයෙන් සිදුවන ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ බාහිර පාරිසරික සාධක වෙනස්වීම් හමුවේ, දළ දේශීය නිෂ්පාදනයට බදු ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය ඉහළ නැංවීමට කටයුතු කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මුහුණ දෙන අභියෝගයක් ලෙස හඳුනාගෙන තිබේ.

#### 2.2.1.2. සෘජු සහ වක්‍ර බදු අනුපාතය

සෘජු සහ වක්‍ර බදු වල යෝග්‍ය සංකලනය පිළිබඳව එකී දෙවර්ගයේ ගුණාංග සහ අඩුපාඩු සම්බන්ධයෙන් දේශපාලනික සහ ශාස්ත්‍රීය කවයන් තුළ විවාදයක් පවතී. රජයේ සමස්ත ආර්ථික කාර්ය සාධනය ස්ථාවර සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට දායක වන ආකාරයට සෘජු සහ වක්‍ර බදු වල යෝග්‍ය සංකලනයන්ගේ තේරීම සිදු කළ යුතුය. ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ මැදිහත්වීම අවධාරණය කෙරෙන ආර්ථික දර්ශනයන් විසින් සෘජු බදුවල ඉහළ දායකත්ව අනුපාතයක්ද වක්‍ර බදුවල අඩු දායකත්ව අනුපාතයක්ද සහිත බදු සංයුතියක් නිර්දේශ කර ඇත. වර්තමානයේදී, 20:80 ක් වන සෘජු බදු හා වක්‍ර බදු අතර සංයුතිය, 60:40 ක බදු සංයුතියක් ලෙස ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සකසන්නන්ගේ අවධානය යොමු වී ඇත. මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මුහුණ දෙන අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇත.

#### 2.2.1.3. නව ආදායම් බදු නීති සම්පාදනයන්

පෙර පැවති බදු පද්ධතියේ සංකීර්ණභාවය සරල කිරීමේ අරමුණින් යුතුව 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව ආදායම් බදු මත වන නීති සම්පාදනයන් හඳුන්වා දුනි. 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත, පවතින පද්ධතියට සහ කාර්ය පටිපාටියට සුවිශාල වෙනස්කම් රාශියක් ගෙන එන ලදී.නව රෙගුලාසි සමග ඉදිරියට ගමන් කිරීමට නිලධාරීන් සහ බදු ගෙවන්නන් යන දෙකොට්ඨාශයම සතුව මනා දැනුමක් සහ අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය බව හඳුනාගෙන ඇත. කලින් පැවති බදු පනත සමග කටයුතු සිදුකරන අතරතුර නව පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ නව පද්ධති වෙනස්කම් හඳුන්වා දීම අභියෝගයක් වී ඇත. දැනුවත් කිරීමේ ක්‍රියාවලිය අභියෝගයක් වුවත්, එයට සාර්ථකව මුහුණ දීමට හැකිවිය.

#### 2.2.1.4. ඊ - ගොනුගතකිරීම් ඉහළ නැංවීම

බදු පද්ධතීන් පහසු කිරීමට සහ බදු අනුකූලතාවය වැඩි දියුණු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2017 දී ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (**RAMIS**) හඳුන්වා දුනි. මෙම පද්ධතිය මඟින් මාර්ගගත ලෙස බදු වාර්තා භාර දීමේ පහසුකම සලසා ඇත. එහෙයින් මාර්ගගත ලෙස වාර්තා ගොනුගත කිරීම ප්‍රචලිත කිරීම සඳහා බදු ගෙවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. කෙසේ වුවත් පසුගිය තක්සේරු වර්ෂ තුන තුල ආදායම් බදු වාර්තා ඊ-ගොනුගත කිරීම, සමස්ථ බදු වාර්තා අනුකූලතාවයෙන් සියයට පහකට වඩා අඩු බව නිරීක්ෂණය වී ඇත. පසුගිය වර්ෂ කිහිපය මුළුල්ලේ ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. එහෙයින්

මාර්ගගත ලෙස වාර්තා ගොනුගත කිරීම ඉහළ නැංවීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගත යුතු ප්‍රධාන අභියෝගයකි.

### 2.2.2. අනාගත අරමුණු

බදුකරණය යනු, ආර්ථිකයේ සමස්ත සංවර්ධනය මූල්‍යායනය කිරීම පිණිස රජය විසින් සම්පත් ප්‍රසම්පාදනය කිරීමට යොදා ගැනෙන උපකරණමය මෙවලමකි. එහෙයින් බදු ගෙවීම් යනු රටක සැම සහ සියලුම පුරවැසියන් සඳහා අනිවාර්ය වන සංසිද්ධියකි. සැම රජයක්ම සිය අවශ්‍යතා සහ අරමුණු සම්බන්ධයෙන් වන විවිධාකාර වූ අභිමතාර්ථයන් සමබර කළ හැකි පෘථුල සහ සංසක්ත බදු පද්ධතියක් පැවතිය යුතුය. ශ්‍රී ලංකාවේ බදු පරිපාලකයකු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය අනාගත අරමුණු සැකසීමේදී, බදු අනුකූලතාවය වැඩි කිරීම බදු ආදායම වැඩි කිරීම සඳහා සංවේදී වන බව නිසි ලෙස හඳුනාගෙන ඇත.

බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීමට උපකාරී වන උත්ප්‍රේරකයන් ලෙස පහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සැලසුම් සකස් කර ඇත.

**I.** ක්‍රියාත්මක කිරීමට නියමිත යෝජිත පරිපාලන ක්‍රමවේද

- ඊ - ගෙවීම් පද්ධතිය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හඳුන්වා දීම ශ්‍රී ලංකා බදුකරණ ඉතිහාසය තුළ පසු කළ ඓතිහාසික ඉතා වැදගත් සිද්ධියක් බව මෙහිදී සඳහන් කළ යුතුය. එහෙයින් සිය වටිනා කාලය, මුදල් සහ පරිශ්‍රමය අපතේ හරිමින් පෝලිම් වල රැඳී නොසිට බදු ගෙවන්නන් ලියාපදිංචිය, බදු වාර්තා පිරවීම, බදු ශේෂය හා ගනු දෙනු ඉතිහාසය පිරික්සීම, ආපසු ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීම, අභියාචනා / විරෝධතා ඉදිරිපත් කිරීම, නිශ්කාශන සහතික ඉල්ලුම් කිරීම යනාදී විවිධාකාර වූ ඊ- සේවාවන් ලබා ගැනීමේ අවස්ථාව බදු ගෙවන්නන් හට ඇති කර දී ඇත. එනමුදු බදුගෙවන ප්‍රජාව, සිය බදු ගෙවීම් සිදු කිරීමේදී මුහුණ දෙන සමහර ගැටලු නිරාකරණය කිරීමට අප අසමත්ව ඇත. එහෙයින් දැනටමත් හඳුන්වා දී ඇති ඊ-සේවාව සඳහා දීර්ඝ කිරීමක් ලෙස 2020 වර්ෂය තුල දී ඊ-ගෙවීම් පහසුකම් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකු සමග සහයෝගීත්වයෙන් යුතුව මාර්ගගත පහසුකම් මගින් බදු ගෙවීම් සිදු කිරීමේ අතුරු මුහුණතක් සැකසීමට අපේක්ෂා කරනු ලැබේ. වර්තමාන බදු ගෙවීම් ක්‍රමවේදයේ ඇති ගැටළු ඉවත් කිරීම සහ ගෙවිය යුතු බදු පහසුවෙන් නිරවුල් කිරීමට වඩාත් සරල හා සුරක්ෂිත ක්‍රමයක් ලබා දීම මෙම ඊ-ගෙවීම් පද්ධතියේ අපේක්ෂාවයි.

- බදු ගෙවන්නා හඳුනාගැනීමට අනන්‍ය අංකයක් භාවිත කිරීම

රටේ බදු පරිපාලකයා ලෙස අනෙකුත් රජයේ නියෝජිත ආයතන සමඟ සමෝධානය වෙමින් බදු හා සම්බන්ධයෙන් වන වටිනා තොරතුරු එක්රැස් කිරීම ඉතාමත් අත්‍යාවශ්‍යය. එහෙයින් බැංකු, සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරා බදු දෙපාර්තමේන්තුව වැනි අදාල නියෝජිත ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ දී අනන්‍ය අංකයක් භාවිත කිරීම අවශ්‍ය වේ. අනන්‍ය හඳුනා ගැනීමේ අංකයක් භාවිතා කිරීමේ මූලික අරමුණ වන්නේ බදු ගෙවන්නා සම්බන්ධයෙන් වන අනෙකුත් තොරතුරු එක්රැස් කිරීමට බදු පරිපාලකයා හට ඉඩප්‍රස්ථා ලබා දීමයි. එහෙයින්, මේ හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇති දත්ත අනෙකුත් ආයතන සමඟ සසඳා බැලීමට ආදායම් නිලධාරීන් හට ඉඩප්‍රස්ථා විවර වන අතර එය බදු අනුකූලතාවය ඉහළ නැංවීමට පැහැදිලි බලපෑමක් සිදු කරනු ඇත.

- බදු පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම

බදු පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම යන්නෙහි සරල අදහස නම්, බදු ගෙවීම සම්බන්ධයෙන් බදු ගෙවන්නා තුල ස්ව කැමැත්තෙන් පෙළඹවීමක් ඇති කිරීමයි. සංවර්ධනය වෙමින් පවතින රටවල බදු ආදායමේ තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා බදු පිළිබඳව බදු ගෙවන්නා දක්වන ආකල්පය ප්‍රධාන දායකත්වයක් ලබා දෙයි. තවද බදු අනුකූලතාවය ඉහළ නැංවීමට ත්‍යාග ලබා දීම, දණ්ඩන හෝ පොලී අයකිරීම හෝ විගණන පැවැත්වීම යනාදිය පමණක් ප්‍රමාණවත් නොවේ. එම නිසා පුරවැසියන් අතර බදු පිළිබඳ ආකල්ප ඉහළ නැංවීම රටක බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීමට පැහැදිලි බලපෑමක් සිදු කරනු ලබයි. රටේ බදු අනුකූලතාවය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව සමාජයේ බදු පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීමට උරදෙන පරිදි අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන් බදු ගෙවන්නන් හට පැවැත්වීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සැලසුම් සකස්කර ඇත.

..............................................................

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

# 03 වන පරිච්ඡේදය

# වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තථ්‍ය 2019 | තථ්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| 385,000,000,000 | ආදායම් බදු | 1 | 427,699,517,596 | 310,449,314,854 | ඒසීඒ-1 |
| 653,129,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 548,243,099,377 | 543,539,590,064 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| **1,038,129,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **975,942,616,973** | **853,988,904,918** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 17,931,655,060 | 14,737,610,371 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 35,453,634,850 | 34,503,389,661 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 119,299,613 | 122,435,927 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | 120,655,621 | 52,823,814 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **53,625,245,143** | **49,416,259,774** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,029,567,862,116** | **903,405,164,692** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 2,734,500,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,712,911,188 | 2,433,263,123 | ඒසීඒ-2(ii) |
| 1,177,205,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,055,973,084 | 963,935,482 | ඒසීඒ-2(ii) |
| 44,550,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 43,849,827 | 42,963,737 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **3,956,255,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **3,812,734,099** | **3,440,162,341** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 143,545,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 114,849,704 | 52,668,048 | |
| 303,660,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 144,550,552 | 327,734,557 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 50,000,000 | හැකියා වර්ධනය | **14** | 42,800,427 | 180,922,912 | |
| 2,453,190,000 | වෙනත් මූලධන වියදම් | **15** | 420,200,893 | 132,812,485 | |
| **2,950,395,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **722,401,576** | **694,138,002** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **37,509,116,981** | **33,677,639,174** | |
| | **තැන්පතු ගෙවීම්** | | 37,367,788,137 | 33,524,853,542 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 141,328,845 | 152,785,632 | **ඒසීඒ-5/5(ඒ)/5(බී)** |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **42,044,252,656** | **37,811,939,517** | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)** | | **987,523,609,460** | **865,593,225,175** | |

# 2019 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සතය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 5,635,976,225 | 5,248,351,927 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 374,582,321 | 352,553,088 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 20,557,301 | - |
| **මුළු වත්කම්** | | **6,031,115,847** | **5,600,905,015** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | (627,171,007) | (2,563,353,527) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 5,635,976,225 | 5,248,351,927 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,001,753,328 | 2,915,906,615 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 20,557,301 | - |
| **මුළු වගකීම්** | | **6,031,115,847** | **5,600,905,015** |

පිටු අංක 5 සිට 38 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 48 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : | දිනය : 2020.02.17 | දිනය : 2020.02.17 |

එස්. ආර්. ආටිගල /2020
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ
මහලේකම් කාර්යාලය
කොළඹ 01

කළුන් ... 
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ 02

ටී. පී. සුවිනීතා මැණිකේ
ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැ.බ.)
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
කොළඹ 02.

## 3.3 මුදල් ප්‍රවාහන ප්‍රකාශය

ඒසීඒ-සී

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තතය 2019 රු. | 2018 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 48,194 | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් (වැන්දඹු, අනත්දරු ලැබීම්) | 88,637,941 | 14,794,094,916 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 31,567,380 | - |
| අග්‍රිම ලැබීම් | 17,931,655,060 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **18,051,908,575** | **14,794,094,916** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 3,768,884,272 | 2,398,780,826 |
| (-) සෘජු හර | (4,194,505) | |
| සහනාධාර සහ මාරුකිරීම් | 43,849,827 | 42,859,177 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,427,362 | - |
| බද්දෙන් ආපසු ගෙවීම (මුදලින්) | 1,162,560,994 | |
| බද්දෙන් ආපසු ගෙවීම (භාණ්ඩාගාරයෙන්) | 774,118,508 | |
| අනෙකුත් ආදායම් ආපසු ගෙවීම් | 3,750 | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 9,656,000,000 | 10,814,706,755 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **15,406,650,207** | **13,256,346,758** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,645,258,368** | **1,537,748,158** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 450,300 | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 96,497,969 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **96,948,269** | **-** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 722,401,576 | 671,621,144 |
| (-) සෘජු හර | (19,434,522) | |

| | | |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 104,528,994 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **807,496,048** | **671,621,144** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(710,547,779)** | **(671,621,144)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **1,934,710,589** | **866,127,014** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 35,453,634,850 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **35,453,634,850** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 37,367,788,137 | 866,127,014 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **37,367,788,137** | **866,127,014** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(1,914,153,287)** | **(866,127,014)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **20,557,302** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |